# 10 මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

සුමංගල පොඩි හාමුදුරුවෝ ශ්‍රී සංඝරාජ පිරිවෙනේ පළමුවන වසරේ ඉගෙනුම ලබති. පන්තියේ දී ඉගෙනීමට නියමිත පාඩම් කලින් කියවා අවබෝධ කරගෙන, ඒවායේ ඇතුළත් කරුණු ධාරණය කරගෙන, පන්තියට පැමිණීම උන්වහන්සේගේ සිරිතකි. එපමණක් නොව ඒවායින් තම ජීවිතයට ලද හැකි ආදර්ශ චරිතායනය කර ගැනුම නිසා උන්වහන්සේ අනෙකුත් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර ද, ගුරුවරුන් අතර ද, ප්‍රසාදයට පත් වූ සාමණේර හිමි නමක් වෙති.



මෙහි, මතු දැක්වෙන්නේ ත්‍රිපිටක ධර්මය විෂයයට අදාළ ''චරිත කතා'' අතර ඇති ''මහා ප්‍රජාපතී ගෝතමී'' පාඩම කියවා අවබෝධ කර ගැනීමටත්, කරුණු මතක තබා ගැනීමටත් උන්වහන්සේ අනුගමනය කළ ක්‍රමවේදය යි.

ඒ සඳහා පාඩම කියවීමෙන් අනතුරුව සුමංගල පොඩි හාමුදුරුවෝ ප්‍රශ්න කිහිපයක් සකස් කරගත්හ. ඒවා මෙසේ ය.

1. මහා ප්‍රජාපතී ගෝතමිය නමින් හැඳින්වූයේ කවුද?
2 එතුමිය තුළ පැවති උදාර ගුණ ධර්ම මොනවාද?
3. භික්ෂුණී ශාසනයේ ආරම්භය උදෙසා ඇයගෙන් සිදුවූ මෙහෙය කුමක්ද?
4. මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු පැවිදි බව පැතූ කාන්තා පිරිසට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ගරු ධර්ම අට සඳහන් කරන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි.

5. මහා ප්‍රජාපතී ගෝතමී චරිතයෙන් අපට ලද හැකි ආදර්ශ පෙන්වා දෙන්න.
6. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ පිරිනිවීම සිදුවූයේ කෙසේද?

මෙම ප්‍රශ්න සඳහා සුමංගල පොඩි හාමුදුරුවෝ කරුණු සංවිධානය කරගත් ආකාරය මෙසේ ය.

## 1. මහා ප්‍රජාපතී ගෝතමිය නමින් හැඳින්වූයේ කවුද?

කෝලිය රට දෙවුදහ නුවර අංජන රජුට යසෝදරා හෙවත් සුලක්ඛණා නම් බිසවගෙන් උපන් දූවරු දෙදෙනෙක් වූහ. එනම්, මහාමායා ගෝතමී සහ ප්‍රජාපතී ගෝතමී යන දෙදෙනා ය. මේ දෙදෙනා ම සක්විති රජවීමට තරම් පින් ඇති දරුවන්ට මවු වන බව ඔවුන්ගේ ග්‍රහචාරයේ සටහන්ව තිබිණ. එ නිසා ශාක්‍ය රටේ රජකම ලැබූ සුද්ධෝදන කුමරා මේ දෙදෙනා ම සිය බිසෝවරුන් කර ගත්තේ ය.

සිදුහත් කුමරුගේ මව වූ මහාමායා දේවිය, කුමරු ඉපදී සත් දිනකින් කලුරිය කළා ය. එතැන් සිට මහා ප්‍රජාපතී ගෝතමිය රජුගේ අග මෙහෙසිය මෙන් ම සිදුහත් කුමරුගේ මව බවට ද පත්වූවා ය. සුද්ධෝදන රජුට දව ඇයට ද නන්ද නම් පුත් කුමරෙකු හා නන්දා නම් දූ කුමරියක් වූහ.

## 2. එතුමිය තුළ පැවති උදාර ගුණ ධර්ම මොනවා ද?

මහා ප්‍රජාපතී ගෝතමිය කිසිවිටෙකත් සිදුහත් කුමරුන්ට මවු නැති අඩුව නොදැනෙන ලෙසට, වැදූ මව හා සමානව ම සිය තනයෙන් කිරි පොවා කුමරු රැක බලා ගත්තා ය. එය ඇයගේ උතුම් මවු ගුණය හෙළි කරන්නකි. කුමරු අභිනිෂ්ක්‍රමණය කළ අවස්ථාවේ ඇය වේදනාව ඉවසා දරා ගත්තේ දැඩි අපහසුවෙනි. එසේ ම උන්වහන්සේ බුද්ධත්වය ලැබූ බව අසා දැඩි සතුටට ද පත්වූවා ය. ඒ දරු සෙනෙහස බුදුවීමෙන් පසුවත් අඩු නොවී ය. ඇය කලකින් ඇඳුමක් අන්දවන්නට නොලැබුණේ යැයි කියා සියතින් ම නූල් කැට, රෙදි වියා, සිවුරක් මසාගෙන වුත් බුදුරදුන්ට පිදුවා ය. උන්වහන්සේ ලෝකයාට ආදර්ශයක් දීමට ''ගෝතමිය, මෙය සංඝයාට පුදන්න. එවිට මා පිදුවා වන්නේ යැයි වදාරා එය සංඝ රත්නයට පූජා කරන ලෙස සුළු මවට උපදෙස් දුන්හ.

## 3. භික්ෂුණී ශාසනයේ ආරම්භය උදෙසා ඇයගෙන් සිදු වූ මෙහෙය කුමක්ද?

බුදුරජාණන් වහන්සේගේ කිඹුල්වත්පුර ගමනේදී බණ අසා මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් වූවා ය. ඇයගේ පුතණුවන් වූ නන්ද කුමරුත්, මුණුබුරා වූ රාහුල කුමාරයාත් පැවිදි බවට පත්වූ හ. කල් ගතවත් ම සුද්ධෝදන රජතුමා ද මහ රහත් භාවයට පත්වී පිරිනිවන් පෑවේ ය. මහා ප්‍රජාපතී ගෝතමියට ද පැවිදි වීමේ අවශ්‍යතාව දැඩිව දැනෙන්නට විය. නිග්‍රෝධාරාමයේ වැඩ විසූ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ මහා ප්‍රජාපතී ගෝතමිය ද පැවිද්ද ඉල්ලුවා ය. එහෙත් ඉඩ නොලැබිණි. තෙවරක් ම මෙසේ අයැද සිටිය ද ස්ත්‍රීන් පැවිදි කිරීමට බුදුරජාණන් වහන්සේ කැමති නොවූහ. ඇය ඉන් මහත් වේදනාවට පත් වූවා ය. මෙකල රෝහිණී ගඟෙහි ජලය බෙදා ගැනීමේ ප්‍රශ්නයක් මත ශාක්‍ය හා කෝලිය වංශිකයන් අතර යුද්ධයක් ඇවිළී ගියේ ය. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කොට දෙපිරිස සමගි කළ හ. දහම් ඇසූ ශාක්‍ය කුමාරවරු පන්සියයක් පැවිදි වූ පසුව ඔවුන්ගේ භාර්යාවෝ ද හිස මුඩු කොට, මහා ප්‍රජාපතී ගෝතමිය ද පෙරටු කොට ගෙන විශාලා මහනුවරට පාගමනින් ම ගොස් ආනන්ද හාමුදුරුවන් වහන්සේ ලවා බුදුරජාණන්වහන්සේ වෙතින් පැවිද්ද ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේ ගරු ධර්ම අටක් ඉදිරිපත් කොට ඒවා පිළිගන්නේ නම් භික්ෂුණී පැවිද්ද ලබා දෙන බව දන්වූහ. ඒවා හිස් මුදුනින් ම පිළිගත් මහා ප්‍රජාපතී ගෝතමිය පළමුව පැවිද්ද හා උපසම්පදාව ලබා භික්ෂුණී ශාසනයේ ආරම්භය සනිටුහන් කළා ය. එතුමිය ''චිරරාත්‍රඥ'' (සසුනේ පැවිදි වී වැඩි කාලයක් ගෙවූ) භික්ෂුණීන් අතර අගතනතුර ද ලැබුවා ය.

## 4. බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ගරු ධර්ම අට සඳහන් කරන්න.

1. උපසම්පදාවෙන් වස් සියයක් ඉක්මවූ මෙහෙණිය වුව ද එදින ම උපසම්පදාව ලැබූ භික්ෂුව දැක වැන්ද යුතු ය. ගරු කළ යුතු ය.
2. භික්ෂූන් නොමැති පෙදෙසක මෙහෙණිය වස් නොවිසිය යුතු ය.
3. මසකට දෙවරක් මෙහෙණිය විසින් භික්ෂූන්ගෙන් පොහොය විචාළ යුතු ය. අවවාද දීම සඳහා එන භික්ෂුවක ගේ පැමිණීම බලාපොරොත්තු විය යුතු ය.
4. වස් අවසානයේ දී භික්ෂු-භික්ෂුණී උභතෝ සංඝයා හමුවේ දී මෙහෙණිය වස් පවාරණය කළ යුතු ය.
5. ගරු ඇවතකට පත් මෙහෙණිය භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා වෙත මානත් පිරිය යුතු ය.

6. අවුරුද්දක කාලයක් ශික්ෂා මානවිකාවක ව සිට මෙහෙණිය උපසම්පදව ලද යුතු ය.
7. මොන ම කරුණක් නිසා වත් මෙහෙණිය භික්ෂුවකට ආක්‍රෝශ පරිභව නොකළ යුතු ය.
8. මෙහෙණිය භික්ෂූන් ට අවවාද නොකළ යුතු ය. භික්ෂූන් විසින් දෙනු ලබන අවවාද මෙහෙණිය පිළිගත යුතු ය.

යන කරුණු අට ''අෂ්ට ගරු ධර්ම'' නමින් හැඳින්වේ.

## 5. මහා ප්‍රජාපතී ගෝතමී චරිතයෙන් අපට ලද හැකි ආදර්ශ මොනවාද?

මහා ප්‍රජාපතී ගෝතමිය කිසිදාක පා ගමනින් දුරක් නොගිය සියුමැලි කාන්තාවකි. යසෝදරාව ඇතුළු එවැනි ම කතුන් පන්සියයක් සමග ඇය කිඹුල්වත් පුර සිට විශාලා මහනුවර දක්වා දුරු මග ගියේ පාවහන් පවා නැතිව ය. එහි සැපත් වන විට ඔවුන්ගේ යටි පතුල් වල දිය පට්ටා නැගී තිබුණි. අව්වට හා දූවිල්ලට ඔවුහු කලු වී දුර්වර්ණ වී සිටියෝ ය. ආනන්ද තෙරුන් වහන්සේ මෙහෙණිසසුන පිහිටුවීම සඳහා අවසර ලබා දෙන තුරු ම බුදුරදුන්ට නොයෙක් කරුණු කියමින් ආයාචනා කළේ මේ මහා වීර්යවන්ත කාන්තාවන්ගේ ජීවිත පරිත්‍යාගය දැක ඇති වූ සංවේගය නිසාම ය. මෙහෙණසස්නට ඉඩ දීම නිසා බුදු සසුනේ ආයු කාලය අඩකින් ම පිරිහෙන බව එදා බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන්ට වදාළහ. එසේ විශාල පාඩුවක් සිදු වෙද්දීත් උන්වහන්සේ මේ අවසරය දුන්නේ, සසර පෙරුම් පුරා ගෙන අවුත් මේ කාන්තාවන් ඔප්පු කළ මහා වීර්යය සඵල විය යුතු නිසා ය.

එසේ ම එතුමියගේ මවු සෙනෙහස ලොව සියලු මවුවරුන්ට ආදර්ශයකි. එතුමිය සිය සොයුරියගේ පුත් සිදුහත් කුමරුන්ටත් තම කිරි පොවා ඇති දැඩි කළා ය. වසර එකසිය විස්සක් ආයු විඳි මහා ප්‍රජාපතී ගෝතමී මහරහත් මෙහෙණිය භික්ෂුණීන් දහස් ගණනක් පැවිදි කොට නිවන් මග යවමින්, තමන් ආරම්භ කළ මෙහෙණි සස්න දියුණු කිරීමට ද කැප වූවා ය.

සමමෙත් ගුණය, නොසැලෙන වීර්යය, නායකත්වය, ඉවසීම හා කැපවීම ආදී ගුණාංග එතුමියගේ චරිතයෙන් ලද හැකි උතුම් ආදර්ශයන් ය.

## 6. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ පිරිනිවීම සිදුවූයේ කෙසේද'යි පහදන්න.

බුද්ධ මාතා යන ගෞරව නාමයෙන් පිදුම් ලැබූ මහා ප්‍රජාපතී තෙරණියෝ බුදු සසුනේ බලවත් මහ රහතුන්ට පමණක් ලැබිය හැකි ත්‍රි විද්‍යා, සිවුපිළිසිඹියා ආදී සියලු ඤාණබල හා ඍද්ධිබල ලබා සිටියෝ ය. ලොවුතුරා සම්බුදුරජාණන් වහන්සේ පිරි නිවීමට තීරණය කොට විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩ වෙසෙන බව දැනගත් ඇය, උන්වහන්සේ හමුවී තමාට පළමුව පිරිනිවීමට අවසර ඉල්ලා සිටියා ය. ඒ සමග ම තමා මෙහෙණි සස්න පිහිටු වීමට උනන්දු වීමෙන් යම් වරදක් සිදුවී නම් ඊට ද සමාව ගත්තා ය.

ඒ මොහොතේ බුදුරජාණන් වහන්සේ, ස්ත්‍රීන්ට පුරුෂයන්ට මෙන් ඤාණබල නැත යන වැරදි මතය දුරු කරන ලෙස එතුමියගෙන් ඉල්ලා සිටි සේක. ඊට එකඟ වී අහසට පැන නැගුණු බුද්ධ මාතාව නොයෙක් විස්මය ජනක ප්‍රාතිහාර්ය පා මිනිසුන්ගේ සැක විමති දුරු කළා ය.

අනතුරුව පන්සියයක් පිරිවර තෙරණියන් සමග බුදු පාමුල වැඳ වැටී, මේ බුදුන් දකින අවසන් මොහොතයැ'යි කියා සමුගත්තා ය. ඉන් පසු සිය මෙහෙණ වරට ගිය එතුමිය වටා විශාල උපාසිකා පිරිසක් රොක් වී හඬා වැලපෙන්නට වූහ. එවිට ''දරුවනි, සියලු සංස්කාර ධර්ම අනිත්‍යය. වෙන්වීම කෙළවර කොට ඇත්තේ ය. වෙනස් වන සුලු ය. මාරයාට හසුවීම ගැන හඬා පලක් නැතැ'යි කියා ඔවුන් සනසා ලූ බුද්ධමාතාවෝ චතුර්ථ ධ්‍යානයට සම වැදී තෙල් සිඳී ගිය පහන් සිලක් සේ පිරිනිවන් පා වදාළහ. එතුමිය සමග තවත් පන්සියයක් තෙරණියෝ ද පිරිනිවන් පෑහ. ඒ මොහොතේ මහ පොළොව ගුගුරා ගියේ ය.

බුදුරජාණන් වහන්සේ එහි වැඩමවා යම්කිසි කෙනෙකු තුළ බුදුන් කෙරෙහි ශ්‍රද්ධාවක් ඇත්නම්, බුදුන්ට යමෙක් ප්‍රිය නම් ඒ බුද්ධපුත්‍රයෝ බුද්ධ මාතාවට ගරු කරත්වා'යි වදාරා, මහසඟන පිරිවරාගෙන මවු සිරුර පසුපස වැඩම කොට ගෞරව දක්වා ආදාහන කරවූ හ.

### ක්‍රියාකාරකම 10.1

1. මහා ප්‍රජාපතී ගෝතමියගේ උදාර ගුණ ඇසුරෙන් කවියක් නිර්මාණය කරන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි.

2. ''මහා ප්‍රජාපතී ගෝතමී'' චරිතය පිළිබඳව පන්තිය ඉදිරියේ කෙටි කතාවක් ඉදිරිපත් කරන්න.

### ක්‍රියාකාරකම 10.2

අෂ්ට ගරු ධර්ම වනපොත් කරන්න.

### ක්‍රියාකාරකම 10.3

හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

1. මහා ප්‍රජාපතී ගෝතමිය .................................... ගේ (යශෝදරාව/ මහාමායා දේවිය) සොහොයුරිය යි.
2. ............................. (නන්ද කුමරු/ රාහුල කුමරු) මහා ප්‍රජාපතී ගෝතමියගේ පුත්‍රයා යි.
3. ශාක්‍ය හා කෝලිය වංශිකයන් අතර ගැටුමක් ඇතිවූයේ ........................... (නේරංජනා/ රෝහිණී) නදියේ ජලය බෙදා ගැනීම සම්බන්ධව යි.
4. භික්ෂුණී ය, භික්ෂූන් ........................... (වෙසෙන/ නොවෙසෙන) පෙදෙසක වස් විසිය යුතු ය.
5. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය .................................. (අවුරුදු 120 ක්/ අවුරුදු 100 ක්) ආයු වැළඳුවා ය.

**ජීවිතයට ඔවදනක්**

**''චිත්තස්ස දමථො සාධු**
**චිත්තං දන්තං සුඛාවහං''**

සිත දමනය කිරීම යහපත් ය.
දමනය වූ සිත සැප ගෙන දෙයි.